[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]



# දෙවන වාර ඇගයීම - 2023

| 11 ශ්‍රේණිය | විෂයය – සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය I | පැය - 01 යි. |
|---|---|---|---|

නම ...........................................................................

**සැලකිය යුතුයි.**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් හිමි වේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) වරණවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

- අංක **01** හා **03** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන පිළිතුරු තෝරන්න.

01. නංගි සියල්ල **ඉස්පිල්ලක් පාපිල්ලක් නෑර** අපට පැවසුවා ය.

(1). සියලු ම ඉස්පිලි පාපිලි සහිතව (2). කිසිවක්ම අත් නොහැර
(3). ඇතැම් කොටස් අමතක කර (4). සෑම දෙනා පිළිබඳව ම

02. අසනීපය **නිට්ටාවටම** සුව කළ නොහැකි බව වෛද්‍යවරයා පැවසුවේ ය.

(1). සම්පූර්ණයෙන් ම (2). සාමාන්‍යයෙන් (3). බාගයක් (4). බෙහෙතක්

03. සමහර ප්‍රදේශවල **කැලෑ නීතිය** තවමත් ක්‍රියාත්මක වේ.

(1). හොරෙන් දැව කැපීම. (2). ඇඳිරි නීතිය
(3). වනසතුන් දඩම් කිරීමට අවසර නොදීම. (4). බලවතා දුබලයා පෙළීම.

- අංක **04** සිට **06** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. එම නගරය පිරිසිදු කිරීම සඳහා ගම් වැසියෝ ........................ ඉදිරිපත් වූහ.

(1). නිරායාසයෙන් (2). අනිවාර්යෙන් (3). ස්වයංක්‍රියව (4). ස්වෙච්ඡාවෙන්

05. කවිත්වය ........................ පහළ වන්නක් නොව නිතර පුරුදු පුහුණු කිරීෙමන් සකසා ගත යුත්තකි.

(1). එක වර (2). නිරායාසයෙන් (3). පරිකල්පනයෙන් (4). අභිමානයෙන්

06. වර්තමානයෙහි, ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අංගය ........................ වෙයි.

(1). අස්ථාවර (2). චංචල (3). උච්චාවචනය (4). නිශ්චල

07. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1). සනාතන, ආශිංසන, උද්ධමනය, ආන්දෝළනය (2). ක්ෂණිකව, පිළිබඳව, වළාකුල, ඍෂ්ධ්‍ය
(3). උද්ඝෝෂණ, ප්‍රශස්ත, කෙළවර, පිරිවෙන (4). ප්‍රවීන, සණ්ටාර, ප්‍රත්‍යාර්ථ, ගෘහස්ථ

08. **ගිගිරි, කෙක්ක, කුඹියා, සාගරය** යන වචනවල පළමු අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1). කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල, දිගු පාපිල්ල, කොම්බුව

(2). දිගු පාපිල්ල, කොම්බුව, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල

(3). ඇලපිල්ල, දිගු පාපිල්ල, කෙටි ඉස්පිල්ල, කොම්බුව

(4). කෙටි ඉස්පිල්ල, කොම්බුව, දිගු පාපිල්ල, ඇලපිල්ල

09. "**තනතුර**" යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,

(1). දන්තජ හා මූර්ධජ ය. (2). දන්තජ හා ඕෂ්ඨජ ය. (3). තාලුජ හා දන්තජ ය. (4). තාලුජ හා මූර්ධජ ය.

10. **ආකාරාදී** පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.

(1). ඉතාලිය, බ්‍රිතාන්‍යය, ජර්මනිය, සුඩානය (2). ඉන්දියාව, කොරියාව, චීනය, ජපානය

(3). ඉන්දුනීසියාව, සිරියාව, රුසියාව, ටිබෙටය (4). ඉතියෝපියාව, ඇමෙරිකාව, බ්‍රසීලය, ග්‍රීසිය

11. අනුක්ත නාමපද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1). රෝගියෙක්, සිවලකු, ශිෂ්‍යාවක, වැදිරියක් (2). සතුරකු, බැල්ලියක්, රියදුරකු, මිනිසෙක්

(3). ගුරුවරයකු, සිඟන්නකු, ගැහැනියක, ළදැරියක (4). වෛද්‍යවරයෙක්, ඉංජිනේරුවකු, සිංහයෙක්, කොටියකු

12. වෙළෙන්දෝ '**පදිකා වේදිකාවෙන්**' ඉවත්ව යති.

යන්නෙහි 'පදිකා වේදිකාවෙන්' යන්නෙහි විභක්තිය කුමක් ද?

(1). කරණ (2). අවධි (3). ආධාර (4). කර්ම

13. "**නිරවුල්**" යන පදය අයත් වන්නේ,

(1). පූර්වස්වරලෝප සන්ධියට ය. (2). ස්වරාදේශ සන්ධියට ය.

(3). ආගම සන්ධියට ය. (4). ගාත්‍රාදේශ සන්ධියට ය.

14. "**අවස්ථෝචිත**" යන පදය නිවැරදිව විසන්ධි කර ඇති වරණය තෝරන්න.

(1). අවස්ථා + ඕචිත (2). අවස් + ථෝචිත (3). අවස්ථා + උචිත (4). අවස්ථෝ + චිත

15. සන්ධි නොවූ පදයක් දැක්වෙන වරණය තෝරන්න.

(1). බළල්ලු (2). සූර්යෝදය (3). පිළියම් (4). පාපියුම්

16. අසම්භාව්‍ය ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය කුමක් ද?

(1). කුරුලු රෑන රන්වන් අහස් ගැබ මැනවින් සරසති. (2). දරුවන් දිනද්දී දෙමාපියෝ සතුටින් උදම් ඇනූහ.

(3). නොකඩවා වැසි වැටුණොත් නායයාම් සිදුවේවි. (4). සුළං හමන විට සරුංගලය ඉහළ අහස කරා ඇදුණි.

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1). නිපාත - දක්වා, පටන්, මෙන්, වහා (2). සන්ධි - වංශාධිපති, රුවනාර, සන්නස්, කුරුල්ලා

(3). මිශ්‍ර ක්‍රියා - දමමින්, රවමින්, විටමින්, ලියමින් (4). තද්ධිත - දුර්වලතා, මුදුතා, සුහදතා, ජනතා

- අංක **18** සිට **19** තෙක් ඇති ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

18. ඔහු **එකුන්විසි** වැනි වියට එළඹියේ

(1). විසි එක් (2). දහ නව (3). තිස් නව (4). විසි නව

19. අපේ සංස්කෘතිකාංග ශ්‍රී ලාංකේය **අනන්‍යතාව** පෙන්වන කදිම කැඩපතකි.

(1). තමාට ම අයත් බව (2). විශිෂ්ට බව (3). වෙනස් බව (4). ස්වාධීන බව

20. විරුද්ධාර්ථවත් පද යුගලයක් **නොවන** වරණය තෝරන්න.

(1). සුභාෂිත - දුර්භාෂිත (2). අභාග්‍ය - දුර්භාග්‍ය

(3). සංකීර්ණ - සරල (4). කුලීන - කුලහීන

21. දී ඇති අක්ෂර ගැළපීමෙන් සැකසෙන සාහිත්‍ය නිර්මාණය ඇතුළත් වරණය කුමක් ද?

(1). යයුකගලා (2). ධිවබෝංය (3). ජාවපූයලි (4). ගැලිපමන

- අංක **22, 23** යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

22. (1). සියලු ක්‍රීඩකයෝ සූදානම් වී ඇත. (2). ගුරුවරිය ශිෂ්‍යාවක් කැටුව කාර්යාලයට ගියා ය.

(3). ඈ උපාසිකාවක විලස සැරසුණා ය. (4). දරුවෝ, අනාගත, පුරවැසියන් ය.

23. (1). ඕ තොමෝ දරුවාට සියලු උපදෙස් දුන්නාහ. (2). අපි පරිසරය පවිත්‍ර ව තබා ගැනීම මැනවි.

(3). ප්‍රේක්ෂකයන් විසින් එම ශිල්පිනිය පිළිගනු ලැබූහ. (4). කම්කරුවෝ තිදෙනෙක් එක්ව වැඩ නිම කළහ.

24. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1). ය, ර, ල, ව යනු අර්ධ ස්වර නොවේ.

(2). රේඵය වෙනුවට රකාරාංශය යෙදිය හැකිය.

(3). ජ් + ඤ් + අ යන අක්ෂර සංයෝජනයෙන් "ඥ" අක්ෂරය නිර්මාණය වේ.

(4). ඍ, ඎ යනු ව්‍යංජන අක්ෂර දෙකකි.

- අංක **25, 26** යටතේ දී ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

25. ගැඹුරට කල්පනා කරන තැනැත්තාට සුළු දෙයක් කිරීම අපහසු වීම.

(1). කළුවා මාරපන් ගියා වගේ. (2). පණ්ඩිතයට ඒදණ්ඩේ යන්න බැරිවා වගේ.

(3). අන්ධයා ඇතාගේ හැටි කිව්වා වගෙයි. (4). කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ.

26. තමන් ප්‍රයෝජන ගන්නේත් නැත. අනුන්ට ප්‍රයෝජන ගැනීමට ඉඩ දෙන්නේත් නැත.

(1). කලක දී වහ කලක දී රහ වෙනවා ලු. (2). ඉත්තෑවගේ ගෙට කබල්ලෑව රිංගුවා වගේ.

(3). කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ. (4). පිදුරු ගොඩේ ඉන්න බල්ල වගේ.

27. පහත සඳහන් වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වන්නේ,

"වැස්ස වහින අවස්ථාවල අතුමෙන් විහිදෙන විදුලි පුපුරු දැක ගන්නට පුළුවන්"

(1). වැස්ස වහින අවස්ථාවල අතුමෙන් විහිදෙන විදුලි පුපුරු දැකගත හැකි වෙති.

(2). වැසි වසින අවස්ථාවලදී අතු වගේ විහිදෙන විදුලි පුපුරු දැකගත හැකි වේ.

(3). වැස්ස වහින අවස්ථාවල දී අතු වගේ විහිදෙන විදුලි පුපුරු දැකගත හැකිවෙයි.

(4). වැසි වසින අවස්ථාවලදී අතු වගේ විහිදෙන විදුලි පුපුරු දැක ගත හැකි වේ.

28. රූපකයක් රහිත පාඨය තෝරන්න.

(1). දහඩිය මුතු ඇට මල් වරුසා වී කරල් බරින් පීදි වැගිරෙයි.

(2). වැඳ රද පද කමල

(3). එතෙපුල් නමැති අමාහැල්ලෙන් කෝ ගිනි කඳ නිවී ගිය

(4). ඇත කෝපයෙන් රත් වැ ගිය යවට වැනි ඇස් ඇති ඇත් රජ යැ

29. මුලින් දී ඇති පදයේ අර්ථය වැරදි ලෙස දී ඇති පිළිතුර තෝරන්න.

(1). වල - වනාන්තරය (2). දළ - දැඩි (3). සරණ - හැසිරෙන (4). නල - සුළඟ

30. මොනරාගල වැසියන් ''කුදහච්චා'' යනුවෙන් ව්‍යවහාර කළේ කුමකට ද?

(1). නිදා ගත්තා යන්නට ය. (2). වාඩිවුණා යන්නට ය.

(3). අවදි වුණා යන්නට ය. (4). අසනීප වුණා යන්නට ය.

31. සමුද්‍රඝෝෂ වීරිතට අදාළ කවි පදය ඇතුළත් වරණය තෝරන්න.

(1). ළඟ ළඟවා උනුනට කර වාදය (2). විදෙන ලෙළෙන නරු බර පුළුලුකළ රැදී

(3). රිවි බිම්බා'යුරු රිවිකුල කමලකර (4). සාර පලය අඹ දඹ රඹ ද වල්පිට

32. ගස වතුසුදු

වී පිරිසිදු

පොහොය නැතු දු

සිල්ගත් බඳු මෙහි රචකයා වන්නේ,

(1). කුමාරතුංග මුනිදාස ය. (2). චන්ද්‍රරත්න මානවසිංහ ය.

(3). මහගමසේකර ය. (4). එස්. මහින්ද හිමි

33. ''කොකේසියන් චෝක් සර්කල්'' නම් නාට්‍යයේ රචකයා වනුයේ,

(1). එදිරිවීර සරච්චන්ද්‍ර ය. (2). බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය.

(3). ඇන්ටන් චෙකෝෆ් ය. (4). හෙන්රි ජයසේන ය.

34. * ගොවියාට තම නිර්මාණාත්මක චින්තනය ................................ වගාව සරු කර ගත හැකි වෙයි.

* සිසුහු පිරිසක් සතුන් වත්ත නැරඹීම ........................................ අධ්‍යාපන චාරිකාවකට සහභාගී වූහ.

* පුරාණ ශ්‍රී ලංකාවේ මෙන්ම ඉන්දියාවේ ද ලේඛන .......................... භාවිත වූයේ තල හා තල් ගස්වල කොළ ය.

* ලෝක සාමය .......................... අධ්‍යාපනය දායක විය යුතු අයුරු ගැන අරුණාචලම් මහතා කරුණු දක්වා ඇත.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙල කුමක් ද?

(1). පිණිස, නිසා, උදෙසා, සඳහා (2). සඳහා, උදෙසා, පිණිස, නිසා

(3). උදෙසා, සඳහා, නිසා, පිණිස (4). නිසා, පිණිස, සඳහා, උදෙසා

35. ''ගවයෝ'' යන පදයෙහි නාම ප්‍රකෘතිය වන්නේ,

(1). ගවයා (2). ගවයන් (3). ගව (4). ගවය

36. පහත සඳහන් වරණයන්හි යෙදී ඇති පුද්ගල නාම හෝ නිර්මාණවල යම් යම් සම්බන්ධතාවක් ඇත. එසේ එකිනෙකට නොගැළපෙන වචනයක් සහිත වරණය තෝරන්න.

(1). මහගම සේකර, ගුණදාර අමරසේකර, විමල් දිසානායක, රත්න ශ්‍රී විජේසිංහ

(2). බුදුගුණාලංකාරය, ගුත්තිලය, කාව්‍යශේඛරය, හංස සංදේශය

(3). මනමේ, සිංහබාහු, වෙල්ලවැහුම්, මළගිය ඇත්තෝ

(4). බුත්සරණ, අමාවතුර, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය

37. "ඒක නොවෙයි මහාධිකරණතුමනි, ප්‍රශ්නය මේ මවගේ හදවත ඇතුළත බුර බුරා නගින දුක් ගින්දරයි." මේ සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍ය කුමක් ද?

(1). මනමේ (2). සිංහබාහු (3). හුණුවටය (4). පුංචි අපට දැන් තේරෙයි

38. විරාම ලකුණු නිවැරදිව යෙදී ඇති වාක්‍ය තෝරන්න.

(1). "කට වහපන්, කට වහපන් කොහොමත් බබුන් ගියේ අවුරුද්දට ඉස්සර වෙලා

(2)." මුබ එව, ඔබ යව, යුද්ධ කරව පමා නොවව"

(3). මහණෙනි මපුතුන් වැන්නවුන්ට භයෙක් කොයින් ද

(4). 4 - 3 අනුපාතයට ගන්න.

39. ශබ්ද ධ්වනිය වඩාත් ඉස්මතු වී පෙනෙන කවි පදය ඇතුළත් වරණය තෝරන්න.

(1). වෙරළ ඉගිළ තුළ රළ වැළ ලෙස උලෙළ (2). දුම්බර ලියෝ කර ඔසවා බලන බැලුම්.

(3). සඳ මඩල වසාගෙන කළු වළාකුළු ඇදිණ. (4). සුරිඳුනි කදිර පුර ලැබ දෙනු මැන පිහිට

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.

"රස වින්දනයට බස දැන ගැනීම අවශ්‍ය වන අතර කාව්‍ය රසවින්දනය හේතුකොට ගෙන බස පිළිබඳ දැනුම ද වර්ධනය වේ."

(1). භාෂාව නොදැන රස වින්දනය කළ නොහැකි අතර භාෂා දැනුම කාව්‍ය රසවින්දනයට බාධාවක් නොවේ.

(2). භාෂා දැනුම ලැබෙන්නේ කාව්‍ය රස වින්දනයට යොමුවීම තුළින් පමණකි.

(3). බස දැන ගැනීමෙන් රස වින්දනය හොඳින් කළ හැකි අතර භාෂා දැනුම තීව්‍ර වීමට කාව්‍ය රස වින්දනය හේතු වේ.

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 11 ශ්‍රේණිය | විෂයය – සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය II | පැය - 02 යි. |
|---|---|---|---|

**සැලකිය යුතුයි.**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **80** ක් හිමි වේ.

01. (i). සිට (x). තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට පිළිතුරු නොලියන්නේ නම් අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i). පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

(අ) ගණ (ආ) ගන

(ii). පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

විවිධ ප්‍රස්තුත මුල් කරගනිමින් දෘෂ්‍යීගෝචර ප්‍රකාශන මාධ්‍යයක් භාවිත කරමින් බිහිවන නිර්මාණ තුළින් ලබන ආශ්වාදය උසස් ය.

(iii). පහත සඳහන් පද නිවැරදිව විසන්ධි කර ලියන්න.

(අ) බත්කුළු (ආ) දැමුණ

(iv). පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) භාෂාවෙහි ශබ්ද හා අර්ථ විග්‍රහ කොට දක්වන ශාස්ත්‍රය

(ආ) අනාදිමත් කාලයක සිට පැවත එන සම්මත පිළිවෙල

(v). පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) මව්තුමූ රසවත් ආහාර පිළියෙල කරයි.

(ආ) සිසුහු හොඳින් පාඩම් කරති'යි ගුරුවරු සිතති.

(vi). තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නාමය ලියන්න.

(අ) උපාසිකාවෝ **බුදුන්ට** මල් පූජා කරති.

(ආ) සිංහය **කූඩුවේ** නිදා සිටියි.

(vii). පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(අ) සිරිත් (ආ) කුලීන

(viii). "බලයි" යන ක්‍රියා පදයේ,

(අ) පූර්ව ක්‍රියා පදය (ආ) ප්‍රයෝජ්‍ය ක්‍රියා පදය

(ix). පහත පදවල ප්‍රකෘතිය ලියන්න.

(අ) කපුටා (ආ) සෝදයි

(x). පහත වාක්‍ය අතරින් කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයටත්, කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරකයටත් හරවා ලියන්න.

(අ) ඇමතිතුමා නව ලේකම්වරියක පත් කරයි.

(ආ) විද්‍යා චක්‍රවර්තීන් විසින් බුත්සරණ රචනා කරනු ලැබීය. (ලකුණු 2×10=20)

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරින් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන තුළ ඇති අක්ෂරය ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ). රටක සංවර්ධනය සඳහා තාරුණ්‍යය අත්වැල් බැඳගත යුතු ය. අනාගතයට උචිත පරිදි දැනුමින් හැකියාවෙන් සන්නද්ධ කිරීම අත්‍යවශ්‍ය කාර්යකි. නව දැනුම නිර්මාණාත්මක බව රටේ යහපත උදෙසා යොමු කර ගැනීමට නම් හොඳ වෙළඳපළක් ගොඩ නගා දී ම ද අවශ්‍ය වේ. ඒ සඳහා අධ්‍යාපනය සතු වන්නේ විශාල වගකීමකි.

(ආ). මිනිස් දිවියක වටිනාකම මෙතෙකැයි තීරණය කළ නොහැක. කුමන හෝ ඛේදනීය තත්ත්වයක් මත දිනකට අහිමිවන මිනිස් ජීවිත ප්‍රමාණය ඉහළ යමින් පවතී. අන්‍ය මතයට හා අන්‍යන්ට ගරු කිරීම වැනි සාරධර්මත් නීතිරීති පිළිගැනීම හා ගරු කිරීම වැනි හරයන් සමාජයෙන් ඉතා වේගයෙන් තුරන්ව යන බව පෙනේ. සියල්ල මූල්‍යකරණය වී ඇති වටපිටාවක අසීමිත ලෙස මිනිස් ජීවිත බිලිවනු දක්නට ලැබේ. මෙම තත්ත්වයෙන් රට මුදා ගැනීමට ආගමික සමාජීය හා ආයතනික අංශ තම වගකීම ඉටු කිරීමට පෙළ ගැසීම වඩා යෝග්‍ය වේ.

(ඉ). දීර්ඝායුෂ සපිරි, ආවේණික ආහාර රටාවකට උරුමකම් කියූ ශ්‍රී ලාංකික ආහාර රටාව බොහෝ දුරට වෙන් වී හමාරය. විවිධ රස කාරක හා විවිධ වර්ණ සහිත ඇස පිනවල වෙළඳපළ ආහාර රටාවකට පුරුදු වී ඇති නිසාම අලුත උපන් දරුවාගේ සිට මහල්ලා දක්වා උරුම කර ගත් ලෙඩරෝග තත්ත්වයන් බොහෝ ය. පිළිකා රෝගීන්ගේ ශීඝ්‍ර වර්ධනයක් ඇති බව ද කියවේ. නැවතත් අපේ ආහාර රටාව, අපේ ජීවන රටාවට හුරුවීම කාලෝචිත වේ.

(ඊ). ඇති වූ වසංගත තත්ත්වය සමගින් දේශීය වෛද්‍ය ක්‍රම සඳහා වැඩි දෙනෙකුගේ නැඹුරුවීමක් දක්නට ලැබුණි. විෂ වෛද්‍ය ක්‍රමය කැඩුම් බිඳුම් වෙදකම ආදී අංශ පමණක් නොව ඇතැම් නිදන් ගත රෝග පිළිබඳව ද දේශීය වෛද්‍ය චිකිත්සාව පිළිබඳ විශ්වාසය විදේශ වල පවා පැතිරෙමින් පවතී. වර්තමානයේ බටහිර වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේ පවතින ගැටලු සහගත තත්ත්වය හමුවේ නවීන විද්‍යාව හා තාක්ෂණය පිටුවහලක් කර ගැනීම මගින් දේශීය වෛද්‍ය සම්ප්‍රදාය තවදුරටත් දියුණු කළ හැකි නොවේ ද.

(ලකුණු 25)

03. පහත දැක්වෙන පාඨය කියවා වචන 50 – 60 අතර වනසේ සාරාංශ කොට ලියන්න. ඔබ ලියූ වචන සංඛ්‍යාව සාරාංශය අවසානයේ වරහනක් තුළ දක්වන්න.

රටට විනිමය යොදා ගත හැකි ආකාරයකට අපනයන අංශය කැපී පෙනෙන වර්ධනයක් ළඟා කර ගැනීම අවශ්‍ය ය. නොඑසේ නම් ආනයන සීමා කරන විදේශ වත්කම් පිරිමසා ගැනීමට මහන්සි වන ආකාරයේ බල කිරීමටකට යා යුතු ය. අද වන විට ශ්‍රී ලංකාවේ විදේශ වත්කම් පිරිහීම අනුව මෙම දෙපැත්තෙන් එක් පැත්තක් තෝරා නොගතහොත් අනාගතය අඳුරු ය. පෙනෙන ආකාරයට මෙරට පුරවැසියන් දේශීය දේ මත වැඩිපුර යැපෙන්නට සූදානම් නැත. විනිමය සීමාවක් අපේක්ෂාවෙන් ආනයනය නතර කළහොත් සහ ආනයන අධෛර්යය කරන ආකාරයට අති විශාල බදු පැනවීම ආණ්ඩුව අර්බුදයකට පත් කරයි. පසුගිය මාස කිහිපය තුළ ආනයනය කරන රථ වාහනවලට අධික බදු පැනවීම එහි එක් පැතිකඩක් අනාවරණය කරයි. ඒ අනුව විදේශ විනිමය උපයා ගැනීම සඳහා සංචාරක ව්‍යාපාරය දියුණු කළ යුතු ය. නොඑසේ නම් විදේශ මුදල් රටට ගෙන එන ආයෝජකයන්ට අයෝජන අවස්ථා සම්පාදනය කළ යුතු ය. මෙකී පැතිවලින් තොර ව පැවැත්මක් නැත. ශ්‍රී ලංකාව තම අපනයනවලින් වැඩි ප්‍රතිශතයක් යවන්නේ බටහිර හා යුරෝපීය කලාපයට ය. එය මෙරට අපනයනවලින් සියයට හැටක පමණ ප්‍රමාණයකි. ලෝක ආර්ථික වර්ධනයෙන් අඩකට වඩා දායක වන සහ අති විශාල ජනගහනයක් සහිත ඉන්දියාව සහ චීනයට මෙරටින් නිර්යාත අපනයනය කරන භාණ්ඩ ප්‍රමාණය සමස්තයෙන් සියයට දහයකටත් අඩු ය. අලුතින් නැගී එන ආසියාව දෙස වඩා අවධානයක් යොමු කිරීම අවශ්‍ය ය. (ලකුණු 10)

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිසාට සුවපහසු ජීවිතයක් ගත කිරීම සඳහාත් ඔහුගේ භෞතික සංවර්ධනය සඳහාත් ජීවනෝපායක් තිබිය යුතු බැවින් සෑම රටක් ම වැඩ කළ හැකි සියලු දෙනාට රැකියා සැපයීමේ වගකීමෙන් බැඳී සිටී. එහෙත් රැකියා වෙළෙඳපොළට පිවිසෙන සියල්ලන්ට ම රැකියා සංවර්ධනය වූ රටවල් පවා තවමත් සමත් වී නැත. විරැකියාව බොහෝ රටවල් මුහුණ පාන ප්‍රධාන ගැටලුවක් වී ඇත්තේ එබැවිනි. තවත් අතකින් කල්පනා කරන විට පෙනී යනුයේ සෑමට රැකියා සැපයීම රජයට ම කළ නොහැකි දෙයක් බවයි. මෙහි දී රජය මගින් කළ යුත්තේ කවර තරාතිරමේ හෝ රැකියා සුලබ කෙරෙන ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කොට ඒවා ක්‍රියාවට නැංවීම ය. ඒ අනුව සෑම පුරවැසියකුට ම තම හැකියා සහ අධ්‍යාපන මට්ටම අනුව කළ හැකි සුදුසු රැකියා රටක් තුළ උත්පාදනය විය යුතු ය. එසේ නො කොට මිනිස් ශ්‍රමය අපතේ හැරීම හෝ ශ්‍රමය අවතක්සේරු කිරීම හෝ සදාචාරාත්මක වශයෙන් කිසිසේත් සාධාරණ නැත. කෙසේ වුව ද, මිනිසාගේ ආර්ථික ප්‍රශ්න දිගින් දිගට ම නො විසඳී පැවතීම නිසා සමාජ සදාචාරය දෙදරා ගිය විට රටක වියවුල් ඇති වීම නොවැළැක්විය හැකි ය. එබැවින් ආර්ථික ගැටලු කොට මිනිසා ආර්ථිකයෙහි වහලකු නො කොට, ආර්ථික බලවේග වහල් කොට ගෙන ජීවිතය හැඩගස්වා ගන්නකු බවට පත් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමයි. මෙහි දී අපගේ අවධානය යොමු විය යුතු තවත් අංශයක් තිබේ. එනම් ආර්ථික සංවර්ධනය ඉලක්ක කොට ගෙන ම නිෂ්පාදන මෙහෙයවීමේ දී නව තාක්ෂණය ජනතාවට අභියෝගයක් විය හැකි බව ය. ලාභය ම ඉලක්ක කොට ගත් ආර්ථික රටාවක් ඉදිරියේ තාක්ෂණයට මිස මිනිස් ශ්‍රමයට ප්‍රමුඛතාව නොලැබී යයි. මිනිසුන් කිහිප දෙනකුගෙන් ඉටු වන වැඩකට එක් යන්ත්‍රයක් යොදා ගැනීම එවිට සිදු වේ. මෙසේ වූ විට, රැකියා පිළිබඳ අරබුදයක් රට තුළ නැවත පැන නගී.

(i). සෑම රටක් ම වගකීමෙන් බැඳී සිටිනේ කවර කරුණක් සඳහා ද?

(ii). සමාජ සදාචාරය දෙදරා යාමට හේතුවිය හැක්කේ කුමක් ද?

(iii). ආර්ථික ගැටලු විසඳීමේ දී වඩාත් ඵලදායී ක්‍රියා ලෙස දක්වා ඇති කරුණු දෙක දක්වන්න.

(iv). ආර්ථික සංවර්ධනය ඉලක්ක කර ගෙනම නිෂ්පාදනය මෙහෙය වීමේ දී අභියෝගයට ලක්වන පාර්ශ්වය කුමක් ද?

(v). වැඩි නිෂ්පාදන සඳහා යන්ත්‍ර භාවිතයට යොදා ගැනීම තුළින් රටක් තුළ රැකියා අර්බුදයක් පැන නගින්නේ ඇයි?

(ලකුණු 2×5=10)

05. පහත දැක්වෙන විස්තරය පදනම් කොට ගෙන අත්පත්‍රිකාවක් සකස් කරන්න. (මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් වේ.)

ලක්ෂිත ජයමාන්න වන ඔබ කුරුණෑගල ඇතුගල් වීදියේ අංක 45 දරණ ස්ථානයේ "හරිත පියස" නමින් වස විසින් තොරව කාබනික පොහොර භාවිතයෙන් වගා කරන ලද එළවළු පලතුරු මෙන්ම දේශීය සහල් වර්ග වලින් යුත් අස්වැන්න සහිත වෙළඳ අංගනයක් විවෘත කිරීමට සැලසුම් කරමින් සිටියි. එය දිනපතා පෙ.ව.8.00 සිට ප.ව. 10.00 තෙක් විවෘතව තිබෙන අතර පෝය දින වලදී ද ප.ව. 2.00 න් පසුව විවෘතව තැබීමට නියමිත ය. දුර්ලබ එළවළු වර්ග මෙන්ම මෙරටට ආවේණික වූ ගුණදායී පලතුරු වර්ග මෙන්ම කුළුබඩු වර්ග ද මිලට ගැනීමේ අවස්ථාව ද මෙමගින් උදා කෙරෙයි. නොවැම්බර් මස 06 වන දින විවෘත කිරීමට නියමිත අතර මෙම මාසය තුළ මිලට ගන්නා ද්‍රව්‍ය වෙනුවෙන් 15% ක වට්ටමක් ලබාදීමට අපේක්ෂා කරන අතර කාර්යක්ෂම සේවය සමගින් වාහන නැවතීමේ පහසුකම් ද ඇති බව දන්වා සිටියි.

හෝ

තීරු ලිපියක මූලික ශිල්පීය ක්‍රම අවබෝධ කරගෙන කසළ බැහැර කිරීම හා නාගරීකරණය තුළ අපේ ක්‍රියාකාරිත්වය යන තේමාව පදනම් කරගනිමින් තීරු ලිපියක් ලියන්න. (වචන 100 ක් පමණ සෑහේ.) (ලකුණු 15)

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]



# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 11 ශ්‍රේණිය | විෂයය – සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය III | පැය - 02 යි. |
|---|---|---|---|

**සැලකිය යුතුයි.**

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- **1, 2, 3, 4 ප්‍රශ්නවලටත්** 5, 6, 7 ප්‍රශ්නවලින් එක් **ප්‍රශ්නයකටත්** පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80** කි.

01. **(i).** සිට **(x).** තෙක් ඇති **සියලු ම** අනු කොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i). "**අපගේ මෙබඳු මන්ත්‍රණයට බාධා කළා වූ පස මිතුරා ගනුම්හ.**"

(අ) මෙසේ පැවසුවේ කවුරුන් ද?

(ආ) මෙහි හා සැබැඳි අවස්ථාව කෙටියෙන් පහදන්න.

(ii). <u>වර</u> වෙණ නද අසමින් සිත සතොසිනි

සර හැර <u>සියොතුන්</u> පියපත් විදමිනි

..............................................................................

..............................................................................

(අ) අංකිත පදවල අරුත් පහදන්න.

(ආ) ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(iii). (අ) ගැමියා විවේකය, දැනුවත්කමින් හා විනෝදයෙන් ගත කිරීම සඳහා යොදා ගත් ජන කවි විශේෂය කුමක් ද?

(ආ) "උපදෙස් දීම සඳහා කී කවි" යන්නට වෙනත් නමක් දක්වන්න.

(iv). සිලිඳුගේ දියණියන් දෙදෙනා නම් කරන්න.

(v). (අ) "නිදහසේ දැහැන" කාව්‍ය සංග්‍රහයේ කතුවරයා කවු ද?

(ආ) එම කතුවරයා උපන් රට කුමක් ද?

(vi). (අ) එම්.එච්. කුඩලිගම හා සමකාලීන කවීන් දෙදෙනෙකු නම් කරන්න.

(ආ) කුඩලිගමයන් ආභාසය ලැබුවේ කවර සාහිත්‍යධරයෙකුගේ නිර්මාණ ද?

(vii). (අ) "පිං ඇති සරසවි වරමක් දෙන්නේ" කෘතිය කවරෙකුගේ ද?

(ආ) එතුමාගේ නවකතාවක් නම් කරන්න.

(viii). (අ) කවි ලකුණු මිණිමල, එළු අත්තනුගලු වංශය, දහම් ගැට මාලාව රචනා කළේ කවරෙක් ද?

(ආ) කෝට්ටේ යුගයේ රචනා වූ සංදේශ දෙකක් නම් කරන්න.

(ix). (අ) "මෙතනින් එහාට තවත් ගෙවල් තියෙනවා ද ?" මෙසේ ඇසුවේ කවු ද?

(ආ) කතුවරයාගේ වෙනත් කෙටි කථාවක් දක්වන්න.

(x). "එසේ වී නම් මම උන් හා එක් වෙමි."

(අ) මෙසේ ප්‍රකාශ ඇතුළත් කෘතිය නම් කරන්න.

(ආ) ඉහත ප්‍රකාශය කවුරුන් කා හට පවසන ලද්දැද්දයි දක්වන්න. (ලකුණු 2×10=20)

02. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i). "නිති නිරිඳුගේ රැකවලෙහි නියුත්තෝ
රුති ලෙස රුපුනොද බිඳ ජය ගත්තෝ
.........................................................................
........................................................................."

(අ) අංකිත පදවල අර්ථ දක්වන්න.

(ආ) මෙහි ඉතිරි පද සම්පූර්ණ කරන්න.

(ii). "යන්ට මේ දැන් සැමියා හැරා
වන වාසෙන් මේ පුතු සමගා
දරුවන් දෙදෙනා
හට සෙත් ලැබෙනා
මග ඔස්සේ යා යුතු වන්නේ
නො සැලී කිසි මෙම වේලේ"

(අ) මෙහි දරුවන් ලෙස දක්වා ඇත් කවුරුන් ද?

(ආ) ඉහත ගීතය ඇතුළත් වන ග්‍රන්ථය නම් කරන්න.

(iii). එ දවස් බුදුහු දෙව්රම්හි වෙසෙමින් අලුයම් සමාහි ලො බලන්නාහු අඟුල්මල් සොරහු දැකැ "මා ගිය කලැ ඔහු සෙත් වෙයි. ගම් නැති තැනැ මහ වල් හා සිටියේ සිවුපදගයක් අසා මා කෙරෙහි පැවිජි වැ රාත් වෙයි."

(අ) ඉහත කොටස ඇතුළත් වූ ග්‍රන්ථය නම් කරන්න.

(ආ) එම ග්‍රන්ථයේ රචකයා හා යුගය දක්වන්න.

(iv). "නිබඳ පැසී පල ලඹ දෙන මිහිරඹය
සුවඳ විහිද සිටි පිළිකුන් කැන් රඹය
නොමද තැනින් තැන වලු බර වනරඹය
එමැද වෙහෙර දිලිදුරලන සසරබය"

(අ) ආංකිත පදවල අරුත් පහදන්න.

(ආ) මුළු කවියේ ම අරුත සරල බසින් ලියන්න.

(v). "තෝ හොර අලිය වගේ මෙතන කකා ඉන්නව. තොට ඒකවත් කරල දෙන්න බැරි ද? කව්ද මෙතන අතක් පයක් නොහොල්ලන එවුන්ට තැම්ම හදල දෙන්ට ඉන්නේ ?" ඔහු බැණ වදියි. එවිට මට සියල්ල හකුලා ගෙන ගොස් ඒ වැඩ රාජකාරි කරදීමට සිදුවෙයි.

(අ) ඉහත ඡේදයේ දැක්වෙන උපමාවක් ලියා දක්වන්න.

(ආ) මෙහි දැක්වෙන "ඔහු" යනුවෙන් හඳුන්වා ඇති පුද්ගලයා කවරෙක් ද? (ලකුණු 4×5=20)

- අංක **03** සහ **04** ප්‍රශ්නවවලට වචන **150 – 200** අතර ප්‍රමාණයක පිළිතුරු තිබිය යුතු ය.

03. "කුරහන් ඉසිමුව කළුවර බලාලා" කවි තුළින්

(i). ගොවියා විඳි දුක් ගැහැට හා

(ii). අභියෝග නිරූපණය කරයි.

එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

**නැතහොත්**

උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව

(i). නිරවද්‍ය ශිල්පයක් උගනීමේ වටිනාකමත්

(ii). ධර්මසේන හිමියන්ගේ කතා කීමේ කලාපත් මනා ලෙස පෙන්නුම් කරයි.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

04. සැළලිහිණි සන්දේශයෙන්

(i). කතු හිමියන්ගේ ප්‍රතිභාවත්

(ii). විවිධ සමාජ ආර්ථික තොරතුරුත් විස්තර කරයි.

නියමිත පද්‍ය ඇසුරෙන් එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

අපට වැසිකිළියක් කෙටි කථාවෙන්

(i). අවස්ථා හා සිද්ධි සජීවී ලෙසින් නිරූපණය කිරීමත්

(ii). පීතෘ මූලික පවුල් පරිසරයක් රසවත් අයුරින් ඉදිරිපත් කිරීමත් දක්නට ලැබේ.

එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් පහදන්න. (ලකුණු 15)

- අංක **05, 06, 07** ප්‍රශ්නවලින් **එකකට** පිළිතුරු ලියන්න. වචන **120 – 150** අතර තිබිය යුතු ය.

05. දියමන්ති මාලය කෙටි කතාවෙන් සිහින ලෝකයක ජීවත් වූ මැටිල්ඩා සැබෑ ලෝකයට පැමිණීමේ අවස්ථා මනා ලෙස පෙන්නුම් කරයි. නිදසුන් තුනක් ඇසුරෙන් පහදන්න.

06. සිංහබාහු නාට්‍යයෙන් තම යුතුකම් හා අයිතිවාසිකම් හොඳින් හඳුනාගත් තරුණයෙකුගේ සිතුවිලි කියා පායි. නිර්දිෂ්ට කොටසින් නිදසුන් තුනක්වත් ඇසුරෙන් විමසන්න.

07. වැරදි කරන පුද්ගලයන් හමුවේ සමස්ත සමාජයම පරිහානියට පත්වන අයුරු "අඟුල්මල් දමනය" කතා පුවතින් විස්තර කරයි. නිදසුන් තුනක්වත් ඇසුරෙන් මෙම කියමන සනාථ කරන්න. (ලකුණු 10)

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama සමානර්ථයක් Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 11 ශ්‍රේණිය | විෂයය – සිංහල භාෂාව හා සාහිත්‍යය | පිළිතුරු |
|---|---|---|

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 01. 2 | 11. 3 | 11. 3 | 11. 2 |
| 02. 1 | 12. 2 | 12. 3 | 12. 1 |
| 03. 4 | 13. 3 | 13. 4 | 13. 2 |
| 04. 4 | 14. 3 | 14. 3 | 14. 4 |
| 05. 2 | 15. 4 | 15. 2 | 15. 3 |
| 06. 3 | 16. - | 16. 4 | 16. 3 |
| 07. 3 | 17. 3 | 17. 4 | 17. 3 |
| 08. 4 | 18. 2 | 18. 4 | 18. 2 |
| 09. 1 | 19. 1 | 19. 3 | 19. 1 |
| 10. 2 | 20. 2 | 20. 1 | 20. 3 |

(මුළු ලකුණු 1×40=40යි.)

## II පත්‍රය

01. (i). (අ) ගණ - සමූහය (ආ) ගන - ඝන බව යන අර්ථ ප්‍රකාශ වන පරිදි වාක්‍ය තනා තිබීම.

(ii). (අ) දෘෂ්ටිගෝචර (ආ) ආස්වාදය

(iii). (අ) බත්+හුළු (ආ) දෙ+අමුණ

(iv). (අ) ව්‍යාකරණ (ආ) සම්ප්‍රදාය

(v). (අ) මව්තුමූ රසවත් ආහාර පිළියෙල කරති.

(ආ) සිසුන් හොඳින් පාඩම් කරති’යි ගුරුවරු සිතති.

(vi). (අ) සම්ප්‍රදාන විභක්තිය (ආ) ආධාර විභක්තිය

(vii). (අ) දුසිරිත් (ආ) කුලහීන

(viii). (අ) බලා (ආ) බලවයි.

(ix). (අ) කපුටු (ආ) සෝද

(x). (අ) ඇමතිතුමා විසින් නව ලේකම්වරියක් පත් කරනු ලබයි. / පත් කෙරෙයි. / ලැබේ.

(ආ) විද්‍යාචක්‍රවර්තීහු බුත්සරණ රචනා කළහ. (මුළු ලකුණු 2×10=20)

02. රචනය සඳහා

- සාරවත් භාවය - ලකුණු 07 (තේමාවට අදාළ බව, සරුබව හා සමබව,
- විස්තරයට අදාළ මාතෘකාව යෙදීම - <u>ලකුණු 01</u> වචන 250 සමීපව පැවතීම.)
  - <u>ලකුණු 08</u>
- සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය - ලකුණු 12
  (උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශනය, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය)
- ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම. - ලකුණු 05
  (අත් අකුරු, වියරණ, විරාම ලක්ෂණ භාවිතය, අදාළ පරිදි ඡේද වෙන් කිරීම) (මුළු ලකුණු 25)

03. සාරාංශකරණය

- අන්තර්ගතය - ලකුණු 06
- වචන ගණන - ලකුණු 02
- ශිල්පීය දක්ෂතා - ලකුණු 02 (ලකුණු 10)

අන්තර්ගත කරුණු -

1. රටට විනිමය යොදා ගන්නා ලෙස අපනයන අංශයේ වර්ධනයක් හෝ ආනයන සීමා කර විදේශ වත්කම් පිරිමසා ගත යුතු ය.
2. පුරවැසියන් දේශීය දේ මත යැපීමට සූදානම් නොවීම.
3. ආනයනය අධෛර්යයට විශාල බදු පැනවීමෙන් ආණ්ඩුව අර්බුදයට පත්වේ.
4. විදේශ විනිමය වර්ධනයට සංචාරක ව්‍යාපාර දියුණු කිරීම හා ආයෝජන අවස්ථා සම්පාදනය කිරීම.
5. ඉන්දියාව හා චීනයට අපනයන කරන භාණ්ඩ සමස්තයෙන් සියයට දහයකටත් අඩු ය.

04. (i). වැඩ කළ හැකි සියලු දෙනාට රැකියා සැපයීමට.

(ii). මිනිසාගේ ආර්ථික ප්‍රශ්න දිගින් දිගටම නොවිසඳා පැවතීම නිසා.

(iii). * ආර්ථිකය මනුෂ්‍යය ජීවිතය කෙරෙහි ඇති කරවන විවිධ බලපෑම් සමථයකට පත් කර මිනිසා ආර්ථිකයේ වහලකු නොකිරීම.

* ආර්ථික බලවේග උපයෝගී කරගෙන ජීවිතය හැඩගස්වා ගැනීමට අවශ්‍ය පසුබිම් සකස් කිරීම.

(iv). ජනතාව

(v). මිනිසුන් කිහිප දෙනෙකුගෙන් ඉටුවන වැඩකට එක් යන්ත්‍රයක් යොදා ගැනීම නිසා මිනිස් (සේවක) අවශ්‍යතාව අඩු වීම නිසා. (ලකුණු 2×5=10)

05. අත් පත්‍රිකාව - මුළු ලකුණු 15 යි.

- ආකෘතිය - ලකුණු 04
- අන්තර්ගතය - ලකුණු 08
- ශිල්පීය දක්ෂතා - ලකුණු 03

ආකෘතිය -

* මාතෘකාව - ලකුණු 01

* පළ කරන්නාගේ නම - ලකුණු 01

* පළ කරන දිනය - ලකුණු 01

* නිර්මාණාත්මකභාවය - ලකුණු 01

අන්තර්ගතය -

* ආයතනයේ නම සඳහන් වීම.
* වස විසෙන් තොර කාබනික පොහොර භාවිත වන බව
* මිලදී ගත හැකි ද්‍රව්‍ය සඳහන් වීම.
* සේවාව ලබාගත හැකි වේලාවන් සඳහන් වීම.
* දුර්ලබ එළවළු හා අවේනික පලතුරු ලබාගත හැකි බව.
* නොවැම්බර් 06 වන දින විවෘත වන බව
* එම මාසය සඳහා 15% වට්ටම ලැබෙන ආකාරය
* කාර්යක්ෂම සේවාව / වාහන නැවැත්වීමේ පහසුකම්

ශිල්පීය දක්ෂතා -

* නිවැරදි අක්ෂර වින්‍යාසය, පැහැදිලි අත් අකුරු, නිවැරදි පද බෙදීම ආදිය

නැතහොත්

තීරු ලිපිය - මුළු ලකුණු 15 යි.

- ආකෘතිය - ලකුණු 04
- අන්තර්ගතය - ලකුණු 08
- ශිල්පීය දක්ෂතා - ලකුණු 03

ආකෘතිය - මාතෘකාවට - ලකුණු 01
ලියන්නා සඳහන් කිරීම - ලකුණු 01
නිර්මාණශීලීත්වය - ලකුණු 02

අන්තර්ගතය - ලියා ඇති කරුණු සලකා ලකුණු පිරිනමන්න.

ශිල්පීය දක්ෂතා - නිවැරදි අක්ෂර වින්‍යාසය, පැහැදිලි අත් අකුරු නිවැරදි පද බෙදීම.

## III පත්‍රය

01. (i). (අ) චූලනී බ්‍රහ්මදත්ත රජතුමා

(ආ) එක් සියයක් රජ දරුවන් මරනු පිණිස ශෘංගිලා (විෂදමා) ඉදි කරන ලද මෙබඳු සුරා පානය මහෞෂධ පණ්ඩිතයන් විසින් බාධා කළේ යැයි කිපී නැවත රහසිගතව කේවට්ටයනට ද මෙලෙස පවසන ලද අවස්ථාව

(ii). (අ) වර - විශිෂ්ට　　සියොතුන් - පක්ෂීන්, කුරුල්ලන්

(ආ) පුරඹර වසමින් සිටි රහ කුම් වැනි

සුර සෙනඟට සුරසුන් පැන වූ වැනි

(iii). (අ) තේරවිලි කවි　　(ආ) දැනමුතුකමට කී කවි

(iv). හින්නිහාමි, පුංචි මැණිකා

(v). (අ) එස්. මහින්ද හිමි　　(ආ) ටිබෙටය

(vi). (අ) පී.බී. අල්විස් පෙරේරා, කපිල සෙනෙවිරත්න, මීමන ප්‍රේමතිලක, උපනන්ද බටුගෙදර, මාකඳුරේ ගුණවර්ධන

(ආ) තාගෝර්ගේ නිර්මාණ

(vii). (අ) එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ (මහාචාර්ය)

(ආ) මළගිය ඇත්තෝ, මළවුන්ගේ අවුරුදු දා

(viii). (අ) විදාගම මෛත්‍රිය හිමි (ආ) හංස, සැළලිහිණි, ගිරා, කෝකිල, පරවි සංදේශ

(ix). (අ) අපටත් වැසිකිළියක් කෙටි කථාවේ කුණු ඉන්ස්පෙක්ටර්

(ආ) පුනරුප්පත්තිය හා තවත් කෙටිකථා හෝ (එතුමාගේ වෙනත් ඕනෑම කෙටි කථාවක්)

(x). (අ) උග්ගසේන නම් සිටුපුත්තුගේ වස්තුව

(ආ) උග්ගසේන සිටු පුත්‍රයා විසින් දෙමව්පියන්ට (මුළු ලකුණු 2×10=20)

02. (i). (අ) නිති - නිරන්තරයෙන්

(ආ) රුපුනොද - සතුරන්

(ii). (අ) සිංහබාහු, සිංහසීවලී

(ආ) සිංහබාහු නාට්‍යය.

(iii). (අ) අමාවතුර

(ආ) ගුරුළු ගෝමී, පොළොන්නරු යුගය

(iv). (අ) ලඹ - එල්ලෙන විලිකුන් - ඉඳුනු

(ආ) සුදුසු ලෙස ලකුණු ප්‍රදානය කරන්න.

(v). (අ) හොර අලිය වගේ

(ආ) තාත්තා (පටබැඳිගේ හේරත්) (ලකුණු 4×5=20)

- ප්‍රශ්න අංක 03 සිට 07 දක්වා ප්‍රශ්නවල පිළිතුරට සුදුසු ලෙස ලකුණු ප්‍රදානය කරන්න.



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න